**www.wsws.org** **ලෝක සමාජවාදී වෙබ් අඩවිය**
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉරාකයේ එක්සත් ජනපද මිලිටරි වාඩිලෑම - සමාජයක් සමූලෝත්පාටනය

*තෙවැනි කොටස*

**The US war and occupation of Iraq—the murder of a society**
**Part 3**

**බිල් වෑන් විසිනි**
**2007 මැයි 22**

*දැන් පස් වෙනි වසරට එළඹ ඇති ඉරාකයේ එක්සත් ජනපද මිලිටරි වාඩිලෑම මගින් උත්සන්න කෙරී ඇති මරනයේ, විනාශයේ හා පැගීමේ ඉමහත් පරිමාව ගෙනහැර දක්වමින් මෑත දී පලවූ වාර්තා මාලාවක් පිරික්සා බැලීම මෙම ලිපි පෙලේ අරමුන යි. කැටිකර ගත් විට එම වාර්තාවලින් ඉරාකයේ එක්සත් ජනපද ක්‍රියාන්විතයන් සෝෂියොසයිඩ් හෙවත් සමස්ත සමාජයක් ම හිතාමතා හා ක්‍රමානුකූලව සමූලඝාතනය කිරීමට සමාන බව තහවුරු කරයි.*

## උසස් අධ්‍යාපනයට එල්ල වී ඇති ප්‍රහාරය

2003 වසරේ පටන් ඝාතනය කෙරී ඇති විශ්වවිද්‍යාල මහාචාර්යවරුන් සංඛ්‍යාව 250 සිට 1000 දක්වා යයි ගනන් බලා ඇත. මෙම විද්‍යාර්තීන් ඉස්ලාමීය තුවක්කුකරුවන්ගේ ඉලක්කය බවට පත්ව ඇත්තේ ඔවුන් ආගමික හා නිකායික බෙදීම් පසෙකට ලන ජාතික අනන්‍යතාවක් හා අනාගමික මතවාදයක් ගෙනයන්නේ යයි ඔවුන්ට පෙනීයන හෙයිනි.

විශ්වවිද්‍යාවලට පහර දීම් මගින් ශිෂ්‍යයන් ද පලවා හැර තිබේ. මෙම වසරේ පලමු තෙමස තුල අල් මුස්ටන්සිරියා විශ්වවිද්‍යාලයට එල්ල කල බෝම්බ ප්‍රහාර දෙකකින් ජීවිත 111ක් බිලිගත්තේ ය.

සමස්ත උසස් අධ්‍යාපන පද්ධතියම - එක් කාලයක දී කලාපයේ හොඳ ම එක ලෙස සැලකූ- බිඳ වැටීමේ තත්වයට පත්ව තිබේ. පන්ති පවත්වනු ලබන්නේ නුපුහුනු උපාධිධාරින් හෝ උපාධි අපේක්ෂකයන් විසිනි.

"ප්‍රචන්ඩත්වය හා සම්පත් හිඟ වීමෙන් ඉරාක අධ්‍යාපන ක්ෂේත්‍රයම දුදුරු වී ගොසිනි." බැග්ඩෑඩ් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ෆුවා අඩ් අබ්දුල් රසාක් එක්සත් ජාතීන්ගේ මාධ්‍ය ආයතනයට ප්‍රකාශ කලේ ය. "මෙම වසරේ කිසිදු සිසුවෙක් ඔහුගේ හෝ ඇගේ රැකියාව කිරීමට අවශ්‍ය සුදුසුකම් සහිතව උපාධිය සමත් නොවනු ඇත. සිසුන් වසර අවසාන කරනු ඇත්තේ ඔවුන් අත් කර ගත යුතු යයි සැලකෙන දැනුමෙන් සියයට 60 කට වඩා අඩු මට්ටමකිනි."

ඔහු තව දුරටත් සඳහන් කලේ විශේෂයෙන් ම වෛද්‍ය ශිෂ්‍යයන් විශ්වවිද්‍යාලවලින් පිටවන්නේ වෛද්‍ය සේවා සැපයීමේ විශ්වාසයෙන් හෝ දැනුමෙන් තොරව බවය. දැන් සහ සදාම් හුසේන්ගේ කාලය අතර සැබැවින්ම විශාල වෙනසක් ඇතිව තිබේ. එවකට වෛද්‍ය සිසුන් විශ්වවිද්‍යාලයෙන් පිටව ගියේ ඕනෑ ම රෝගියෙකුට ප්‍රතිකාර කිරීමේ දැනුම ඇතුව ය.

ආර්ථික විනාශය හා ජනතාවගේ දුගීභාවය වැඩී යාම සමාජ පදනමේ දී ඉරාක ආර්ථිකය ඇනහිටීමට ලක්ව තිබේ. ඉරාක සමාජ කටයුතු අමාත්‍යාංශය මගින් වාර්තා කල පරිදි නිල විරැකියා අනුපාතය සියයට 48කි. යමෙක්, දැනට වසාදමා ඇති රාජ්‍ය ව්‍යවසායන්හි හිටපු සේවකයන් ලක්ෂ ගනනක් තවමත් තමන්ගේ පැරනි වැටුපෙන් සියයට 40ක් ලබාගන්නා බව සැලකිල්ලට ගන්නේ නම් මෙම සංඛ්‍යාව සියයට 70 දක්වා ඉහල නගිනු ඇත.

2006 දී උද්ධමන අනුපාතය ලෝකයේ දෙවැනි ඉහල ම අගය සලකුනු කරමින් සියයට 50 දක්වා ඉහල නැගුනි. ආහාර ද ඇතුලත් මූලික අවශ්‍යතාවන්ගේ මිල ඉහල යෑම ඉමහත් බහුතරයක් ඉරාක වැසියන්ගේ ජීවන තත්වයන් කෙරෙහි නාටකාකාර ලෙස බලපෑවේ ය. යාන්තමින් පසු ගිය දෙවසරක කාලය තුල පමනක් ඉන්ධන මිල පස් ගුනයකින් ඉහල ගොස් ඇත. ඉරකයේ එක්සත් ජාතීන්ගේ ආධාර වැඩ සටහන මගින් අප්‍රේල් මාසයේ දී නිකුත් කල වාර්තාවකින් පෙන්වා දී ඇත්තේ ජනගහනයෙන් සියයට 54ක් දිනකට ඩොලරයකට අඩු මුදලකින් යාන්තම් පන නල ගැට ගසා ගන්නා බවය. ඉරාක පාලන තන්ත්‍රයේ මධ්‍යම සංඛ්‍යාලේඛන ආයතනය මෙම හෙලිදරව් කිරීම් ප්‍රතිරාවය කරමින් කියා සිටින්නේ ඉරාක වැසියන්ගෙන් සියයට 43ක් අත්‍යාවශ්‍ය ආහාර, ඇඳුම්පැලඳුම් හෝ හිසට වහලක් නොමැතිව "අන්ත දරිද්‍රතාවයෙන්" පීඩාවට පත්ව සිටින බවයි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගනන් බැලීම් අනුව රටේ දල දේශීය නිෂ්පාදිතයේ ඒක පුද්ගල පංගුව ඩොලර් 1687කි. මෙය 25 වසරකට පෙර වාර්තා වූ සංඛ්‍යාවෙන් අඩකටත් අඩු ප්‍රමානයකි. ඇමරිකානු ආක්‍රමනිකයාගේ ප්‍රධාන උත්සුකය වන තෙල්

නිෂ්පාදනය පවා බෙහෙවින් පහත වැටී තිබුනු ආක්‍රමනයට පෙර මට්ටම් කරා ඉහල නැංවිය යුතුව තිබේ. නිෂ්පාදිතයෙන් වැඩි කොටසක් සොරකම් කරනු ලබන බව පෙනීයන අතර කඩාකප්පල් කිරීම් ද නිෂ්පාදනය පහත වැටීමට හේතු වී තිබේ.

සන්නද්ධ ප්‍රචන්ඩත්වය හා කඩාකප්පල්කාරීත්වයටත් වඩා එක්සත් ජනපද ආක්‍රමනික බලධාරීන් විසින් බල ගන්වා ඇති තීන්දු, ආර්ථික අර්බුදය හා දසලක්ෂ සංඛ්‍යාත ඉරාක වාසීන්ට ඉන් ඇති කර තිබෙන දුක් පීඩා ගැඹුරු කර තිබේ. එක්සත් ජනපදය පදනම් කරගත් සංගතවල ලාභාපේක්ෂාවන් ද එක්සත් ජනපද පරිපාලනයේ දක්ෂිනාංශික දෘෂ්ටිවාදය ද විසින් දුවවන එල්. පෝල් බ්‍රිමර්ගේ නායකත්වයෙන් යුත් වාඩිලාගත් තන්ත්‍රය, තොග පිටින් පෞද්ගලීකරනය, හා ලක්ෂ පහක් රැකියාවල නියුතුව සිටි රාජ්‍ය ව්‍යවසායන් 192ක් වසා දැමූහ.

*වොෂින්ටන් පෝස්ට්* පුවත්පත මෑතක දී සඳහන් කලේ මෙම ව්‍යවසායන් අතර - බ්‍රිමර් විසින් යල්පිනූ හා අකාර්යක්ෂම යයි නම් කල සියල්ල - දකුනු බැග්ඩෑඩයේ දක්ෂ කලමනාකරුවන් හා නිපුන සේවකයන් සහිත නවීන එකලස් කිරීමේ පේලි සහිත බස් හා ට්‍රක්රථ කම්හලක් වසා දැමූ අතර 75ක් හැර 10,000ක් වූ සේවකයන් දොට්ට දැමී ය. මුලින් එහි එකම ගැනුම්කරුවා වූ ඉරාක ආන්ඩුවට ඉන් වාහන මිලට ගැනීම තහනම් කෙරුනි."

පැහැදිලිවම මෙහි අරමුන වූයේ ජාතික ආර්ථිකය මුලිනුපුටාදමා, පවත්නා වූ කුමන හෝ ලාභදායී අංශයන් එක්සත් ජනපද අන්තර්ජාතික සංගතයන්ට විකුනා දැමීමත් සියල්ලටමත් වඩා, එක්සත් ජනපද තෙල් සමාගම්වලට ඉරාක තෙල්බිම්වල පාලනය අල්ලා ගැනීමට මග පාදා ගැනීමත් ය.

ඉරාක කෘෂිකර්මය ආරක්ෂා කිරීමේ අරමුනෙන් පනවා තිබූ සියලු තීරුබදු ඉවත් කිරීමට බ්‍රිමර් නියෝග කලේ ආනයනික භාන්ඩ වඩා ලාභ කිරීම සඳහා බව කියා පාමිනි. මෙහි අරමුන - එය නොදැනුවත්ව කල බව විශ්වාස කිරීම දුෂ්කරය - අඛන්ඩ මිලිටරි ප්‍රහාරයක් මගින් දැනටමත් නිෂ්පාදනය අඩාල වී ඇති ඉරාකයේ ගොවිපලවල් බංකෙලොත් කිරීමය. වාඩිලෑම දැක් පස්වෙනි වසරට එළඹ තිබිය දී ඉරාකයේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය බිඳවැටී ඇති අතර රට මුලුමනින්ම ආනයනික ආහාර මත රඳා පවතියි. ඒවා අලෙවි කෙරෙන්නේ ජනගහනයෙන් වැඩි කොටසකට ලඟාවිය නොහැකි තරම් ඉහල මිලට ය.

අවසානයේ දී එක්සත් ජනපද විජිතවාදී පාලකයා "සමතලා බද්දක්" පැනවූ - එක්සත් ජනපදය තුලම දක්ෂිනාංශික රිපබ්ලිකානුවන්ගේ සිහිනය වන - අතර ඉරාක ආර්ථිකයේ දේශීය නිෂ්පාදකයින්ට සමාන වූ අයිතීන් විදේශ සමාගම්වලට ද ලබා දෙමින් සියලු ලාභ සිය රට ගෙන යාහැකි පරිදි නියෝග නිකුත් කලේ ය.

එක්සත් ජනපද යුද අපරාධ සඳහා ඉරාක වැසියන්ට චෝදනා කිරීම

වොෂින්ටනයේ ඩිමොක්‍රටික් හා රිපබ්ලිකන් යන දෙකොට්ඨාශයම දැන් කල්පනා කරන්නේ ඉරාකෙ ව්‍යසනයේ චෝදනාව ඉරාක ජනතාව මතම පැටවීමේ දේශපාලන වාසිය ගැනීමට ය. ඔවුන් චෝදනා මුඛයෙන් ප්‍රකාශ කරන්නේ එක්සත් ජනපද හමුදාවන් නිකායවාදී සිවිල් යුද්ධයකට හසුව ඇති බවත් තීරනාත්මක ලෙස ප්‍රචන්ඩත්වය මැඩ පවත්වා දේශපාලන, ආර්ථික හා සමාජ කොන්දේසි වෙනස් කිරීමට ඉරාක ආන්ඩුව අසමත්ව ඇති බවටත් ය.

මේ සියල්ල ස්වාර්ථකාමී හා කුහක මනස්ගාත ය. පලමුවෙන්ම ඉරාකය තුල පවත්නා නිකායවාදී ප්‍රචන්ඩත්වය නීත්‍යානුකූලව ද, දේශපාලනිකව හා සදාචාරාත්මකව ද මුලුමනින්ම වොෂින්ටනයේ වගකීමකි. එක්සත් ජනපදය වාඩිලාගත් බලයක් වන අතර ජිනීවා ප්‍රඥප්තීන් යටතේ ග්‍රහනයට ගෙන ඇති ජනතාව ගේ ආරක්ෂාව සහතික කිරීමට බැඳී සිටියි. එහෙත් සෑම සතියක ම දහස් සංඛ්‍යාත ඉරාක වැසියන් මරා දමනු හෝ හානියට පත් කරනු ලබන අතර දස දහස් ගනන් සිය නිවෙස්වලින් පලවාහරිනු ලැබේ.

මූලිකව ම නිකායවාදී ප්‍රචන්ඩත්වය පුපුරායාම කෙලින්ම උත්තේජනය කලේ එක්සත් ජනපද පිලිවෙතෙනි. ඊට පෙර සිටි යටත්විජිත ආක්‍රමනිකයන් මෙන් ම ඉරාකයේ ආධිපත්‍යය පිහිටුවීමට වොෂින්ටනය ද උත්සාහ කරන්නේ බෙදා පාලනය කිරීමේ පිලිවෙතක් මගිනි. මින් පෙර ඉරාකය තුල කිසි විටෙක නොතිබූ ආකාරයෙන් සුන්නි හා ෂියාවරුන් අතර බෙදීම් ඇති කර වාර්ගික - ආගමික රේඛා ඔස්සේ යලි පිහිටුවීමට ඔවුන් උත්සාහ කරන්නේ රටේ සියලු ජාතික ආයතනයක්ම විනාශ කර තිබෙන අතර ය.

එක්සත් ජනපද ආක්‍රමනික බලධාරීන් ඉරාකය තුල මතුවෙමින් එන රූකඩ පාලන තන්ත්‍රයේ දේශපාලන තනතුරු බෙදා දී ඇත්තේ නිකායික රේඛාවන් ඔස්සේ ය. සුන්නි හා ෂියාවරු අතර ආතතීන් උග්‍ර කරමින් ආරක්ෂක හමුදාවන් බාර කර ඇත්තේ ෂියා ආගමික පක්ෂවල සන්නද්ධ කන්ඩායම් වෙතට ය.

දැන් එක්සත් ජනපද ආක්‍රමනිකයා පැමින ඇත්තේ බැග්ඩෑඩයේ සුන්නි නිවහන් ප්‍රදේශ වට කර තාප්ප ඉදි කිරීමට උත්සාහ දරන තැනකට ය. වාර්ගික රේඛා ඔස්සේ ජනතාව බෙදා වෙන් කරන මෙම ක්‍රියාවලිය ප්‍රතිරාවය කරන්නේ රටවල් ගනනාවක් තුල ගෙනගිය විජිතකරන ත්‍රස්තවිරෝධී යුද්ධය එසේම වෝසෝහි යුදෙව්වන් කොටුකිරීමේ නාසීන්ගේ ක්‍රියාවන් සිහි ගන්වයි.

එක්සත් ජනපද ආක්‍රමනයට පෙර සුන්නි හා ෂියාවරුන් බැග්ඩෑඩයේ හා අනෙකුත් නගරවල ගැටුමකින් තොරව එකිනෙකාට මුහුන ලා ජීවත් වූ අතර සිය අසල්වාසියාගේ ආගමික පසුබිම ප්‍රශ්නයක්

වූයේ නැත. ඉරාකයේ විවාහයන්ගෙන් තුනෙන් එකක් ම සිදු වූයේ මෙම ජන කොටස් දෙක අතර ය. දැන් මෙම වාර්ගික-ආගමික අනන්‍යතාව දසලක්ෂ සංඛ්‍යාවකට ජීවිතයත් මරනයත් අතර ප්‍රශ්නයක් වී තිබේ. සිය නිවෙස්වලින් පලායාමට බලකෙරී ඇති මොවුන් සන්නද්ධ භටයන් ගේ සමූහ ඝාතනයන්ට මුහුන දී සිටිති.

ඉරාක ආන්ඩුව ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය යන ඉල්ලීම් තරයේ ම දේශපාලන ප්‍රදර්ශනය සඳහා ය. එක්සත් ජනපදය පාලනය කරන හරිත කලාපය තුල පිහිටි නූරි අල්මලිකි ගේ නායකත්වයෙන් යුත් පාලන තන්ත්‍රය බොහෝකොට ම බෙලහීන රූකඩයකි. රටපුරා සැබෑ පාලනය පවත්වා ගෙන යන්නේ එක්සත් ජනපදය යි.

පසු ගිය සතියේ චැතම් හවුස් නමැති ප්‍රමුඛ බ්‍රිතාන්‍ය බුද්ධි මන්ඩලයක් විසින් නිකුත්කල වාර්තාවකින් මෙම යථාර්ථය සනිටුහන් කලේ ය. එහි ඉරාක ආන්ඩුව විස්තර කෙරෙන්නේ "සමාජ ආර්ථික හා දේශපාලන ජීවිතයේ පාලනය සම්බන්ධයෙන් ගත් විට බොහෝ කොට ම අනදාල වන" බවයි. අවිවාදිතව ම තත්වය නොසඟවා පැවසීමක් නොවුව ද එය සඳහන් කලේ රට අසාර්ථක රාජ්‍යයක් බවට පත්වීමේ අද්දරට පැමින ඇති බවයි.

## ටයිග්‍රිස් ගංගාවට විෂ මුසු කිරීම

ඊඩින්ගේ උයනේ සිට ගලා එන ගංගාවේ අත්තක් ලෙස බයිබලයේ සඳහන් වන ටයිග්‍රිස් ගංගාව, පුරාතන කාලයේ පටන් කලාපයේ ශිෂ්ඨාචාරයන්හි ඓතිහාසික ජීව රුධිරය ද වන අතර එයට සිදු කර ඇති හානිය ඉරාකයෙන් එන බිහිසුනු කථාන්තර අතර වඩාත්ම සංකේතාත්මක එකය. අමු කැලිකසල රසායනික ද්‍රව්‍ය හා එක්සත් ජනපද යුද්ධය හා වාඩිලෑම මගින් නිපදවා ඇති විෂ සහිත මිලිටරි අපද්‍රව්‍ය වලින් ගතයුත්තක් නැති තරම් දූෂනය වූ පලල් වූ හා දුගඳ හමන ජලමාර්ගයක් බවට එය පත්කර තිබේ.

ගංගාව මලමිනී දමන තැනක් බවට ද පත්ව තිබේ. දිනපතා ජලයෙන් ගොඩ ගන්නා ඒවා බොහොමයකම බිහිසුනු වධ දීමේ ලකුනු පෙන්වයි. ඉරාකයේ අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශයේ නිලධාරියෙකු උපුටා දක්වූ එක්සත් ජාතීන්ගේ මාධ්‍ය ආයතනය සඳහන් කරන්නේ අපද්‍රව්‍ය හා සැල්වීනියා රඳවා ගැනීමට යොදා තිබෙන යකඩ දැල් සහිත ගංගාවේ එක් කොටසකින් පමනක් 2006 ජනවාරියේ සිට මලමිනී 800ක් ගොඩදමා ඇති බවයි.

එක්සත් ජනපද ජර්මානු හා බ්‍රිතාන්‍ය මාධ්‍ය ආයතනයන් මගින් මාර්තු මාසයේ දී පැවැත් වූ මත විමසුමකින් ඉරාක ජනතාවගේ විඥානය මත සිව් වසරක එක්සත් ජනපදයේ සිව්වසරක වාඩිලෑමේ ප්‍රතිවිපාක යම් තරමකින් හෝ හෙලි කෙරෙයි. එක්සත් ජනපද හමුදා රැඳී සිටීම කෙරෙහි ඉරාක වැසියන්ගේ විරෝධය 2005 දී සියයට 65ක සිට දැන් සියයට 78 දක්වා වැඩි වී ඇති බවත් 2004 දී සියයට 17ක් පමනක් වූ එක්සත් ජනපද හමුදාවන්ට සන්නද්ධ ප්‍රහාර එල්ල කිරීමට සහාය දක්වන සංඛ්‍යාව දැන් බහුතරයක් වන සියයට 51 දක්වා වැඩි වී ඇති බවත් එය සඳහන් කරයි.

මහජන මතයේ එවන් නාටකාකාර වෙනස පැහැදිලි කල හැක්කේ, ලේ ස්නානයකට ගොදුරු වී සිටින්නවුන් හා සිය සමාජය සුන්බුන් ගොඩක් බවට පත්ව තිබෙනු දැක ඇති ඉරාක ජනතාවට එරෙහිව කර තිබෙන අපරාධයන්ගේ පරිමාවෙහි දෘෂ්ටි ආස්ථානයේ සිට පමනි.

මේ වනාහි ලෝක ඓතිහාසික අපරාධයන් ය. ලක්ෂ සංඛ්‍යාත ඉරාකීයන්ගේ ද දහස් ගනනක් ඇමරිකානුවන්ගේ ද මරනයන් සඳහා වගකිව යුතු - හා සමස්ත සමාජයක්ම ක්‍රමානුකූලව විනාශ කිරීම සඳහා - අය දඬුවම් නොලබා ම එක්සත් ජනපදය තුල බලයේ ප්‍රමුඛස්ථානයන්හි වැජඹෙති.

## 'පූර්ව භංග යුද්ධය' හා නියුරම්බර්ග් පූර්වාදර්ශය

රිපබ්ලිකානු ධවල මන්දිරයේ හා ඩිමොක්‍රටික් කොන්ග්‍රසයේ වොෂින්ටන්හි ආන්ඩුව, "පූර්වභංග යුද්ධයේ" එනම් ප්‍රකෝප නොකල ආක්‍රමනශීලීත්වය එක්සත් ජනපද විදේශ පිලිවෙතේ ප්‍රධාන අවිය ලෙස වැලඳගෙන සිටිති. එක්සත් ජනපද ජනාධිපති හා විරුද්ධ පක්ෂය ලෙස පෙනී සිටින ඩිමොක්‍රටිකයන්ගේ ප්‍රමුඛයන් ඉරානය ට එරෙහි යුද්ධයක දී වඩාත් විනාශකාරී ලෙස යලි ක්‍රියාවට නඟන බවට නිරන්තරයෙන් තර්ජනය කරති.

අමරිකානු මහජනතාව මුහුන දෙන හදිසි දේශපාලන කර්තව්‍යයන් වන්නේ ඉරාක යුද්ධයට වගකිවයුත්තන් පිලිබඳව පූර්න අපරාධ පරීක්ෂනයක් පවත්වා නඩු පැවරීම යි. නව හා ආක්‍රමනයේ වඩාත් ලේවැකි යුද්ධ වැලැක්වීම සඳහාත් එක්සත් ජනපදය තුල ම මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එල්ල කෙරෙන පෙර නොවූ විරූ ප්‍රහාරයන් නතර කර ආපසු හැරවීම සඳහා ත් මෙය නොකර ම බැරි ය.

මොහොමඩියාහි 14 වියැති ගැහැනු ලමයෙකු සමූහ වසයෙන් දූෂනය කර මරා දැමීම හා ඇගේ මුලු පවුල ම ඝාතනය කිරීම වැනි භීෂනයන්ට වගකිව යුතු ඛනිෂ්ඨ හමුදා සෙබලුන්ට එරෙහිව පවරා ඇති නඩු කිහිපයක් හෝ මැරීන් භටයන් විසින් **හදිතා** හි සිදු කල ඝාතනය මෙම හුදකලා ප්‍රචන්ඩත්වයන්ට පමනක් නොව සමස්ත සමාජයක්ම දූෂනය කිරීම සඳහා තරයේ ම වගකීම දරනවුන් හා එයට දඬුවම් නොලැබීමේ නිදහස භුක්ති විඳින අය පිලිබඳ යථාර්ථය සලකනු කිරීම පමනකි.

ඇමරිකානු පාලක පන්තියේ මූල්‍ය හා භූ දේශපාලන අවශ්‍යතාවන් පෙරට ගෙනයාමේ හා බොරුවේ පදනම මත ගෙනගොස් ඇති සමස්ත සමාජයක් ම විනාශ කිරීමේ ක්‍රියාවලිය ඓතිහාසික පරිමානයේ යුද අපරාධයක් ලෙස සැලකේ. නියුරම්බර්ග් හි ජර්මනියේ තුන්වෙනි රීචයේ ප්‍රමුඛයන්ට දඬුවම් කිරීමට යොදාගත් එම මූලධර්මයන්ගේ ම පදනම මත හා එම නීතිරීති යටතේ ම මොවුන්ට ද දඬුවම් පැමිනවිය යුතු ය.

ඉරාක යුද්ධය දියත්කිරීමට වගකිව යුත්තන් ලෙස සැලකෙන්නේ හුදෙක් ජෝර්ජ් බුෂ්, චේනි, රම්ස්ෆීල්ඩ් හා වොල්ෆොවිට්ස් වටා සිටි දක්ෂිනාංශික රිපබ්ලිකානුවන් කන්ඩායම පමනක් නොවේ. එයට යුද්ධය ශක්‍ය කලා වූ ඩිමොක්‍රටිකයන් ද එයින් ලාභ බලාපොරොත්තු වූ මූල්‍යායතන හා  එක්සත් ජනපද බලශක්ති සමාගම්වල ප්‍රධානීන් ද, එය ප්‍රචාරය කල මාධ්‍ය ඒකාධිකාරයන්හි ප්‍රධානීන් ද ඇතුලත් වේ. එක්සත් ජනපදයේ මූල්‍ය වංශාධිපතිත්වය හා දේශපාලන සංස්ථාපිතය ද ඇතුලත් මෙම සියලු ස්තරයන් හැට වසරකට පෙර නාසීන්ට දඬුවම් පැමිනවූ එම මූලික අපරාධයට ම, එනම් ආක්‍රමනකාරී යුද්ධයකට කුමන්ත්‍රනය කිරීම හා එය ක්‍රියාත්මක කිරීමට වරදකරුවෝ වෙති.

මෙම අපරාධයන් දඬුවම් නොලබාම ගිලිහී ගියොත් හා ඊට වගකිව යුත්තන් දඬුවම් නොලබා දිගටම සිටියහොත් එක්සත් ජනපදයේත් නිසැකව ම ලෝකයේ ත් දේශපාලන, සමාජ හා නිසැකව ම සදාචාරාත්මක ජීවිතය කෙරෙහි එමගින් මාරාන්තික ඇඟවුම් ගැබ් කරගනු ඇත. එමගින් සිදු වනු ඇත්තේ යුද අපරාධයන්ගේ හා ප්‍රචන්ඩත්වයේ ඊ ලඟ වටය වඩාත් පහසු හා නොවැලැක්විය හැකි වීම පමනකි.

ඉරාක යුද්ධයට එරෙහි අරගලය ගෙන යා යුත්තේ සියලු එක්සත් ජනපද හමුදා වහාම හා කොන්දේසි විරහිතව ඉවත් කර ගන්නා ලෙස ද ඉරාක ජනතාවට මානුෂීය හා ආර්ථික ආධාර සැපයීමේ දැවැන්ත වැඩ සටහනක් ක්‍රියාත්මක කරන ලෙස ද මෙම යුද්ධයට වගකිව යුතු සියල්ලන්ට ස්වාධීන හා ජාත්‍යන්තර අධිකරනයක් හමුවේ නඩු පවරන ලෙස ද ඉල්ලීමේ පදනම මත ය.

එක්සත් ජනපදයේ මධ්‍යවාර මැතිවරනවලින් සය මසක් ගතවූ තැන පුලුල්ලෙස සනාථ වූයේ මෙම කිසිදු ඉල්ලීමක් පවත්නා දේශපාලන පක්ෂ හෝ ආන්ඩුවේ ආයතන මගින් සාක්ෂාත් කල නොහැකි බවයි. මෙම ලිපි පලවන විට, පසු ගිය නොවැම්බරයේදී යුද්ධයට එරෙහිව පලවූ විශාල ඡන්දයේ ප්‍රතිඵල වසයෙන් කොන්ග්‍රසයේ නායකත්වය අත් කර ගත් ඩිමොක්‍රටිකයන්, ඉරාකයේ ලේ ස්නානය පවත්වා ගෙන යාමට අතිරේක ඩොලර් බිලියන ගනන් සම්පාදනය කරන්නා වූ පනතක් සකස් කිරීම සඳහා සිය රිපබ්ලිකන් සගයන් හා ධවල මන්දිර නිලධාරින් සමග අගුලු ලා ගත් දොරවල් පිටුපස සාකච්ඡා කරමින් සිටිති. යුද්ධයේ විරුද්ධවාදීන් ලෙස තව දුරටත් වඩා විනිවිද දක්නා ඔවුන්ගේ රංගනය පිටුපසින් ඩිමොක්‍රටිකයන් පැහැදිලි කර ඇත්තේ 2003 ආක්‍රමනයෙහි අධිරාජ්‍යවාදී අරමුනුවලට ද ඒවා මුදුන්පත් කර ගැනීම සඳහා ලක්ෂ ගනන් එක්සත් ජනපද හමුදා රැඳවීමටත් අධිෂ්ඨාන ශීලීව සිටින බවත් ය.

යුද්ධය අවසන් කර යුද කුමන්ත්‍රනකරුවන් වරදකරුවන් කිරීමටත් - ආක්‍රමනයේ වඩාත් විනාශකාරී ක්‍රියාවන් තවදුරටත් සිදුවීම වැලැක්වීමත් - සාක්ෂාත් කල හැක්කේ රිපබ්ලිකන් හා ඩිමොක්‍රටික් යන යුද්ධයේ පක්ෂ දෙකට ම එරෙහි සෘජු දේශපාලන අරගලයක් තුලින් පමනි. යුද්ධය ගෙනයාම තුලින් අවශ්‍යතාවන් ඉටු කර ගැනීමට කැපවී ගත් ඇමරිකානු මූල්‍ය කතිපයාධිකාරයට එරෙහිව යොමු කල සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත කම්කරු පන්තියේ ස්වාධීන මහජන දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීම සඳහා කම්කරුවන්, ශිෂ්‍යයන් හා තරුනයන් සටන්වැදිය යුතු ය.

**සමාප්තයි.**

© www.wsws.org